# විද්‍යාඥයකු ලෙස

# පරිසරය නිරීක්ෂණය කරමු





විද්‍යාව - 2 ඒකකය

6 ශ්‍රේණිය

# පටුන

1- පරිසරයේ අන්තර්ගතය නිරීක්ෂණය කිරීම

2- පරිසරයේ තිබෙන දේ හඳුනා ගැනීම

3- පරිසරයේ ඇති සංසිද්ධි හඳුනා ගැනීම

# 1- පරිසරයේ අන්තර්ගතය නිරීක්ෂණය කිරීම

අප අවට පරිසරයේ ඇති
දේවල් මොනවා ද?




අපේ පරිසරය අපේ වටපිටාවයි.

# අපේ වටපිටාව යනු

අප වටා ඇති සියලු ම දේවල් ය.

අප අවට පරිසරය කොටස් දෙකකට බෙදිය හැකි ය.



- සමීප පරිසරය
- දුරස්ථ පරිසරය

# සමීප පරිසරය



ඔබ ආසන්නයේ ම ඇති වටපිටාව

උදා :- නිවස, පාසල , ගෙවත්ත





# දූරස්ථ පරිසරය





ඔබට බොහෝ දුරින් ඇති වටපිටාව

උදා :- ඉර, හඳ, තරු





පරිසරයේ ඇති දෑ ආකාර කීපයකට

වර්ගීකරණය කළ හැකිය.



- ද්‍රව්‍ය
- සංසිද්ධි



මෙම වර්ගීකරණයට අයත් නොවන තවත් වර්ගයකි.







- ශක්ති

# ද්‍රව්‍ය



පරිසරයෙන් ඉඩක් අයත් කර ගන්නා දේ

**ද්‍රව්‍ය**

නම් වේ.





# ද්‍රව්‍ය.....

## අතින් ස්පර්ශ කළ හැකි ද්‍රව්‍ය

- වාහන
- පුටු
- මේස
- පෑන

## අතින් ස්පර්ශ කළ නොහැකි ද්‍රව්‍ය.

- වාතය



වාතය පරිසරයේ ඉඩත් ලබා ගනී.
තව ද වාතයට ස්කන්ධයක් (බරක්) ඇත.





## සංසිද්ධි

සිදුවන කිසියම් දෙයක්.

- හිරු පෑයීම
- සුළඟ හැමීම
- මල් පිපීම
- බීජ පැළවීම

# ශක්ති

පරිසරයේ ද්‍රව්‍ය, සංසිද්ධිවලට අමතර ව **ශක්ති** විශේෂ ද ඇත.

මේවා මඟින් කිසියම් කාර්යයක් ඉටු කරයි.

උදාහරණ -

- ධ්වනි ශක්තිය (ශබ්දය)
- ආලෝක ශක්තිය (ආලෝකය)
- තාප ශක්තිය (තාපය)
- චුම්බක ශක්තිය (කාන්දම්)

# නිරීක්ෂණය

<u>සංවේදී ඉන්ද්‍රියයන්</u>

හා

<u>ආධාරක උපකරණ</u>

යොදා ගනිමින්
පරිසරයේ ඇති
ද්‍රව්‍ය හා සංසිද්ධි
හඳුනා ගැනීම

→ **නිරීක්ෂණය යි.**





# සංවේදී ඉන්ද්‍රියයන්

ශරීරයේ සංවේදී ඉන්ද්‍රියයන් පහකි.



# සංවේදී ඉන්ද්‍රියයන්...

අප ශරීරයේ ඇති යම් දැනීමක් (සංවේදනයක්)

ලබාදෙන අවයව (ඉන්ද්‍රිය )

**සංවේදී ඉන්ද්‍රියයන්**

නම් වේ.

# සංවේදී ඉන්ද්‍රියයන්..

ඉහත එක් එක් සංවේදී ඉන්ද්‍රියයන් මඟින් ලබා ගන්නා සංවේදන පිළිබඳ ව දැන ගැනීමට පහත රූපයේ අදාළ තැන් click කරන්න.



# ආධාරක උපකරණ

විවිධ නිරීක්ෂණ ලබා ගැනීමට උපකාරී වේ.














# ආධාරක උපකරණ

නිරීක්ෂණ ලබා ගැනීමට උපකාරී වේ.

| සංවේදී ඉන්ද්‍රියය | නිරීක්ෂණය | ආධාරක උපකරණ |
|---|---|---|
| සම | උණුසුම /සිසිල | දේහ උෂ්ණත්වමානය |
| ඇස | දුර ඇති දේ බැලීම<br><br>කුඩා අකුරු ලොකු කර බැලීම | ප්‍රිස්ම දෙනෙතිය, දුරේක්ෂය<br><br>අත් කාචය |
| කන | හදවතේ ක්‍රියාකාරිත්වය ඇසීම | වෙද නළාව |

## නිරීක්ෂණ ආකාර දෙකකින් සිදුකරනු ලබයි.

1. අපේක්ෂිත නිරීක්ෂණය

බලාපොරොත්තු වන දේ නිරීක්ෂණය කිරීම

2. අනපේක්ෂිත නිරීක්ෂණය

බලාපොරොත්තු නොවන දේ නිරීක්ෂණය කිරීම

# 2- පරිසරයේ තිබෙන දෑ හඳුනාගත හැකි ක්‍රම

**පරිසරයේ ඇති දෑ**

- 1 වන ක්‍රමය
  - ස්වාභාවික දෑ
  - කෘත්‍රිම දෑ
- 2 වන ක්‍රමය
  - සජීව දෑ
  - අජීව දෑ
- 3 වන ක්‍රමය
  - ද්‍රව්‍යමය දෑ
  - ද්‍රව්‍යමය නොවන දෑ

## පරිසරයේ ඇති දෑ

### ස්වාභාවික ද්‍රව්‍ය
(පරිසරයේ ස්වාභාවික ව පවතින දෑ)

- ශාක
- ජලය
- මල්
- කඳු
- ගංගා

### කෘත්‍රිම ද්‍රව්‍ය
(මිනිසා විසින් සාදන ලද දෑ)

- නිවාස
- ගොඩනැගිලි
- වාහන
- පාලම්
- බෝක්කු

# පරිසරයේ ඇති දෑ

## සජීව ද්‍රව්‍ය (පණ ඇති දෑ)

- මිනිසා
- කුරුල්ලෝ
- මල්
- බීජ

## අජීව ද්‍රව්‍ය (පණ නැති දෑ)

- ගොඩනැගිලි
- වාහන
- පාලම්
- බෝක්කු

# පරිසරයේ ඇති දෑ

## ද්‍රව්‍යමය දෑ
(අතින් ඇල්ලිය හැකි දෑ)

- ජලය
- සතුන්
- ශාක
- ගල්
- වාහන

## ද්‍රව්‍යමය නොවන දෑ - **ශක්ති**
(අතින් ඇල්ලිය නොහැකි දෑ)

- තාපය
- ධවනිය
- ආලෝකය
- විද්‍යුතය
- චුම්බකත්වය

# 3- පරිසරයේ ඇති සංසිද්ධි හඳුනා ගැනීම

**පරිසරයේ ඇති සංසිද්ධි ආකාර තුනකි.**

- පුනරාවර්ති සහ පුනරාවර්ති නොවන
- ස්වයංසිද්ධ සහ ස්වයංසිද්ධ නොවන
- ජීව පරිසරය හා සම්බන්ධ සහ අජීව පරිසරය හා සම්බන්ධ

# පරිසරයේ ඇති සංසිද්ධි

## පුනරාවර්ති සංසිද්ධි (නැවත නැවත සිදුවන සිද්ධි)

- උදයට හිරු පැයීම
- සවසට හිරු බැසීම
- ජලය වාෂ්ප වීම
- වර්ෂාව ඇති වීම
- සඳේ කලා වෙනස් වීම

## පුනරාවර්ති නොවන සංසිද්ධි (නැවත නැවත සිදුනොවන සිද්ධි)

- ගැරඩියා මීයාව ආහාරයට ගැනීම
- භූමි කම්පන
- සුනාමි කම්පන
- ලෝහ මල බැඳීම
- ගසකින් ගෙඩියක් බිමට වැටීම

# පරිසරයේ ඇති සංසිද්ධි

## ස්වයංසිද්ධ සංසිද්ධි (ඉබේ සිදුවන සිද්ධි)

- මල් කැකුළු පිපීම
- අකුණු ගැසීම
- ආහාර නරක් වීම
- හතු පිපීම
- හිරු පෑයීම

## ස්වයංසිද්ධ නොවන සංසිද්ධි (ඉබේ සිදුනොවන සිද්ධි)

- ජලයට කෘමිනාශක දැමීම මගින් ජල දූෂණය
- කෘමිනාශක දැමීම මගින් පසේ සරු බව විනාශ වීම
- වන සංහාරය නිසා ශාක හා සත්ත්ව විශේෂ වඳ වී යාම

# පරිසරයේ ඇති සංසිද්ධි

## ජීව පරිසරය හා සම්බන්ධ සංසිද්ධි

- බීජ පැලවීම
- සතුන්ගේ ප්‍රජනනය
- මල් කැකුළු පිපීම
- ද්‍රව්‍ය දිරාපත් වීම

## අජීව පරිසරය හා සම්බන්ධ සංසිද්ධි

- යකඩ මල බැඳීම
- භූමි කම්පන
- ගිනි කඳු පිපිරීම
- සුනාමිය

# පාරිභාෂික වචන

| | |
|---|---|
| Artificial | - කෘත්‍රිම |
| Automatic | - ස්වයංක්‍රීය |
| Classification | - වර්ගීකරණය |
| Content | - අන්තර්ගතය |
| Energy | - ශක්තිය |
| Chemical Energy | - රසායන ශක්තිය |
| Electrical Energy | - විද්‍යුත් ශක්තිය |
| Heat Energy | - තාප ශක්තිය |
| Light Energy | - ආලෝක ශක්තිය |
| Magnetic Energy | - චුම්බක ශක්තිය |
| Sound Energy | - ධ්වනි ශක්තිය |

# පාරිභාෂික වචන

- Environment - පරිසරය
- Instruments - උපකරණ
- Binocular - දෙනෙතිය
- Hand lens - අත්කාචය
- Microscope - අන්වීක්ෂය
- Telescope - දුරේක්ෂය
- Thermometer - උෂ්ණත්වමානය
- Living - සජීව
- Material - ද්‍රව්‍යමය
- Natural - ස්වාභාවික
- Non-living - අජීව

# පාරිභාෂික වචන

- Non –material - ද්‍රව්‍යමය නොවන
- Non-recurrent - පුනරාවර්තී නොවන
- Non-spontaneous - ස්වයංසිද්ධ නොවන
- Observation - නිරීක්ෂණය
- Scientific observation - විද්‍යාත්මක නිරීක්ෂණය
- Phenomena - සංසිද්ධිය
- Recurrent - පුනරාවර්තී
- Scientist - විද්‍යාඥයා
- Senses - සංවේදන
- Sense organs - සංවේදී ඉන්ද්‍රියන්
- Spontaneous - ස්වයංසිද්ධ
- Things - ද්‍රව්‍ය